# වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තරඟය 2014

## ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

තරුණ පරපුරේ නිර්මාණ ශක්තිය හා නිපුණතා වැඩි දියුණු කර ගැනීම උනන්දු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් වයස අවු 12 - 19 දක්වා වන ශ්‍රී ලාංකික තරුණ පරපුර වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යංශය හා අනුබද්ධව වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තරඟය සංවිධානය කරනු ලැබේ.

නව නිර්මාණයක් යනු දැනට භාවිතයේ නොමැති යම් භාණ්ඩයක්, මෙවලමක් හෝ සංකල්පයක් අලුතින් හඳුන්වා දීමයි. නව නිපැයුමක් යනු මූලික සංකල්පයක් මත සකස් වූ දැනට භාවිතයේ නොමැති නිර්මාණයක්, ශිල්පීය ක්‍රමයක් හෝ මෙවලමක් ප්‍රථම වරට හඳුන්වා දීමය. මෙය නව නිර්මාණයකට වඩා බෙහෙවින් වෙනස්ය. දැනට පවත්නා නිර්මාණ, ශිල්පීය ක්‍රමයක් හෝ මෙවලමක් මනාව අධ්‍යයනය කොට එම නිපයුමට මුලාරම්භය දුන් සමාජමය අවශ්‍යතාවය හදුනා ගෙන එහි ප්‍රභවයට යාමෙන් එම අවශ්‍යතාවය සඳහා වෙනත් මූලික සංකල්පයන් යොදා ගත් නවතම නිර්මාණය "පරිකල්පන නිර්මිතය" (Innovative Design) නමින් හැඳින්වේ. එය පලමු නිර්මාණයේ අනුකරණයක් නොවිය යුතුයි.

මේ සඳහා ඉල්ලුම් පත්‍ර හා මෙම තරඟයට අදාළ සියළුම විස්තර අඟල් 9 x 4 ප්‍රමාණයේ මුද්දර ගැසූ ලිපිනය සහිත ලියුම් කවරයක් ලියුම් කවරයේ වම් ඉහළ කෙලවරේ "නව නිර්මාණකරු සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර 2014 ජූනි 01 දිනට පෙර නියෝජ්‍ය විධායක ලේකම්, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, 120/15, විජේරාම මාවත, කොළඹ 07 ලිපිනයට එවීමෙන් හෝ www.iesl.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

සම්පූර්ණ කළ අයදුම්පත ඉදිරිපත් කරන නිර්මාණයේ විස්තරද සහිතව ඉහත සඳහන් ලිපිනයට හෝ ed@sltnet.lk හා jiy.iesl@ymail.com යන ඊ මේල් ලිපිනයන්ට 2014 ජූලි 01 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාරදෙන සියළුම අයදුම්කරුවන් සඳහා නව නිර්මාණකරණය පිලිබඳව වැඩමුළු පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර ඒ පිළිබඳ වැඩි විස්තර ලිපි මගින් පසුව දැනුම් දෙනු ලැබේ. ඒ අනුව පලාත් මට්ටමේ තරඟ ජූලි මාසය තුලදී ද, අවසාන තරඟය 2014 අගෝස්තු මාසය තුලදී ද පැවැත්වේ.

විවිධ අංශ වලින් තේරී පත්වන පලමු, දෙවන හා තෙවන ජයග්‍රාහකයින් සඳහා පදක්කම් සහ මුදල් ත්‍යාග, සහ සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. ප්‍රථම ජයග්‍රාහකයන් දසදෙනාට හිමිවෙන ප්‍රදානයන්, මෙම ආයතනයේ වාර්ෂික සැසිවාරයට සමගාමීව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2014 ඔක්තෝබර් මස පැවැත්වෙන උත්සවයේදි, ප්‍රදානය කෙරේ. කුසලතා සහතික සහ මුදල් ත්‍යාග ටෙක්නෝ ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේදී ප්‍රධාන අමුත්තා අතින් පිරිනැමෙනු ඇත. මීට අමතරව මූලික තරඟවලට සහභාගි වන සියළුම තරඟකරුවන්ටද සහභාගිත්ව සහතික පත්‍ර හිමිවනු ඇත.ජයග්‍රාහකයින්ට ආයතනයේ වාර්ෂික සැසිවාරය හා සමගාමීව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2014 ඔක්තෝබර් මාසයේ

පැවැත්වෙන ජාතික ඉංජිනේරු ප්‍රදර්ශනයේදී (ටෙක්නෝ 2014) ඔවුන්ගේ නිර්මාණ, ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලැබෙනු ඇත.

ජයග්‍රාහකයන් අතුරෙන් තෝරා ගන්නා පස් දෙනෙකුට විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසාන වනතෙක් බල පැවැත්වෙන ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ. ජයග්‍රාහකයන් අතුරෙන් තෝරා ගන්නා දස දෙනෙකුට මොරටුව විශ්ව විද්‍යාලයේදී තාක්ෂණික පුහුණුවක් ලබා දෙන අතර “Intel” සමාගම මගින් ලොව පුරා පවත්වන නිර්මාණකරු තරඟයට(Intel International Science & Engineering Fair) සහභාගිවන හා ප්‍රථම ජයග්‍රාහකයන් දසදෙනාට IESL College of Engineering හි ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය හදාරන්නේනම් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් ශිෂ්‍යත්වයක් පිරිනමනු ලැබේ. මෙම තරඟය සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන හොඳම ආචාර්යවරයා සඳහාද මුදල් ත්‍යාගයක් ඇතුළුව විශේෂ සහතිකයක් පිරිනමනු ලැබේ.

“Intel” සමාගම මගින් ලොව පුරා පවත්වන නිර්මාණකරු තරඟයට(Intel International Science & Engineering Fair) සහභාගිවන හා ප්‍රථම ජයග්‍රාහකයන් දසදෙනාට IESL College of Engineering හි ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය හදාරන්නේනම් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් ශිෂ්‍යත්වයක් පිරිනමනු ලැබේ.

“Intel” සමාගම මගින් ලොව පුරා පවත්වන නිර්මාණකරු තරඟයට (Intel International Science & Engineering Fair) සහභාගිවීමේ අවස්ථාවද මෙම තරඟයේ ජයග්‍රාහකයන් හට ලැබිය හැක. එම තරඟය ඇමරිකාවේ දී 2015 මැයි මස පැවැත්වීමට නියමිතය. මෙම තරඟයේ ත්‍යාග මුදල ඩොලර් මිලියන 4ක් පමණ වේ.

පසුගිය වසරවලදී **JIY** තරඟයේ ජයග්‍රාහකයින් කිහිප දෙනෙකුම Intel ISEF තරඟයේ විවිධ අංශයන්ගෙන් රටවල් හැට ගණනක සිසුන් පරදවා පලමු ස්ථාන දෙකක්, තෙවන ස්ථානයක් හා කුසලතා සම්මාන රාශියක් ජයග්‍රහණය කිරීමට සමත් විය. ඔවුනට ලැබුණු විශාල ත්‍යාග මුදලට අමතරව, අලුතින් සොයා ගන්නා ග්‍රහලෝකද ඔවුන් නමින් හැඳින්වීමට Masachuselts Institute of Technology ආයතනයේ Lincoln Laboratory තීරණය කර ඇත.

ඉංජිනේරු ජයවීලාල් මීගොඩ
උප සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
120/15, විජේරාම මාවත, කොළඹ 07
071-4150720

**ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පවත්වන වසරේ කණිෂ්ඨ නිර්මාණකරු තරඟය සඳහා අයදුම්පත් දැන් බාරගනු ලැබේ.**

**071-3535329, 071-8735338, www.iesl.lk**